# පළාත් පාලන නීති


**නීතිඥ එස්.ජී. පුංචිහේවා**



විනිවිදභාවයෙන් හා මහජන සහභාගිත්වයෙන් යුතු
ප්‍රාදේශිය ආණ්ඩු (පළාත් පාලන) ගොඩනැගීමේ වැඩසටහන
ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශය
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

**පළාත් පාලන නීති**

ප්‍රථම මුද්‍රණය 2007 මැයි

ISBN 978-955-1655-09-9

පිටකවර සැකැස්ම හා පරිගණක සැකැස්ම **දිලීප හේමන්ත**

මුද්‍රණය **ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් - 011 2329739**

ප්‍රකාශනය **විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කථිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්ති විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

වැඩිදුර විස්තර සඳහා
**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**
**ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශය**
32/7, මල් පාර, කොළඹ 07.
දුරකථන : 011-2370801-4 ෆැක්ස් : 011-2370802
ඊමේල් cpa@cpalanka.org

USAID ආධාර මත ආසියානු පදනම විසින් ක්‍රියාත්මක කරනු ලැබූ පාරදෘෂ්‍යය හා වගකීමෙන් යුතු පළාත් පාලනය පිළිබඳ වැඩසටහන යටතේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මුද්‍රණය කරන ලදී.

# පෙර වදන

මෙම කුඩා පොතෙහි ඇත්තේ පළාත් පාලන ආයතන වර්ග තුනේ බලතල හා කාර්යයන් ගැන එම නීතිවල දැක්වෙන දේය. පනත් වල සඳහන් කරුණු වඩා සරල ලෙසත් සාරාංශ ලෙසත් දක්වන්නේ පාඨකයාගේ පහසුව සඳහාය. මෙය ක්‍රියාකාරීන්ට මෙන්ම මහජනතාවටද එකසේ ප්‍රයෝජනවත් වනු ඇතැයි සිතමු.

නීතිඥ එස්.ජී. පුංචිහේවා

**පටුන** **පිටුව**

| | | |
|---|---|---|
| 1. | පළාත් පාලනය | 7 |
| 2. | පළාත් පාලන මැතිවරණ පැවැත්වෙන්නේ කෙසේ ද? | 9 |
| 3. | පළාත් පාලන ආයතන පිහිටුවන්නේ කෙසේ ද | 12 |
| 4. | පළාත් පාලන ආයතනවල බලතල හා කාර්යයන් මොනවා ද? | 15 |
| 5. | මුදල් හා මූල්‍ය පාලනය | 30 |
| 6. | අයවැය ලේඛනය | 35 |

# පළාත් පාලනය

## පළාත් පාලන ආයතන මොනවාද?

1. ප්‍රාදේශීය සභා
2. නගර සභා
3. මහනගර සභා

### පළාත් සභා

පළාත් පාලන ආයතන නොවේ පළාත් සභාවක් යනු කලාපයක පාලනය සඳහා යම් සීමිත ව්‍යවස්ථාදායක සහ විධායක බලතල පැවරුණු ආයතන වර්ගයකි.

## පළාත් පාලනය සඳහා බලය ලැබෙන්නේ කෙසේ ද?

රටේ ප්‍රධාන නීතිය වූ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙනි. 13 වන ආ.ක්‍ර.ව්‍ය සංශෝධනයේ 9 වන උපලේඛනයේ 4.1, 4.2, 4.3 ව්‍යවස්ථා මගිනි.

## එම බලය ලැබෙන්නේ කාටද? කුමකටද?

පළාත් පාලන අමාත්‍යාංශයට සහ පළාත් සභාවේ ඊට සමාන අමාත්‍යාංශයට ය.

පළාත් පාලන අමාත්‍යාංශයත්, පළාත් සභාවත් එක් වී පළාත් සභාවේ ආකෘතිය, වගකීම්, ප්‍රතිපත්ති, නිලකාලය තීරණය කොට පළාත් පාලන අමාත්‍යාංශයට සහ පළාත් සභාවේ ඊට සමාන අමාත්‍යාංශයට ය.

පළාත් පාලන අමාත්‍යාංශයත්, පළාත් සභාවත් එක් වී පළාත් සභාවේ ආකෘතිය, වගකීම්, ප්‍රතිපත්ති, නිලකාලය තීරණය කොට පළාත් පාලන ආයතන පිහිටවනු ඇත.

## පළාත් සභාවට පැවරෙන බලතල මොනවා ද?

කලාපය තුළ පිහිටි පළාත් පාලන ආයතන කටයුතු අධීක්ෂණයට පාලනයට හා විසුරුවා හැරීමට බලය ඇත. මේ සඳහා ආණ්ඩුකාරවරයා, අමාත්‍යවරයා, පළාත් පාලන කොමසාරිස්වරයා, සහකාර කොමසාරිස්වරයා සහ වෙනත් රජයේ නිලධරයන් ගේ සේවය ලබා ගැනේ.

## පළාත් පාලනය සිදුවන නීත්‍යානුකූල භාෂාව කුමක් ද?

අදහස් පළකිරීම හා පරිපාලනය සිදුවන්නේ සිංහල හෝ දෙමළ භාෂාවන්ගෙනි (ආණ්ඩු. ව්‍ය. 19,20 සහ 22) උතුරු - නැගෙනහිර පරිපාලනය දෙමළ භාෂාවෙනි. යම් උප දිසාපති කොට්ඨාසයක ජන අනුපාතය අනුව වෙනත් භාෂාවක් භාවිතා කිරීමට ජනාධිපති විධාන කළ යුතුය.

පළාත් පාලන ආයතනයේ අණ පනත්, අතුරු ව්‍යවස්ථා ලිපි ලේඛන, චක්‍ර ලේඛ, ආකෘති පත්‍ර එම පළාත් පාලන ආයතනය කටයුතු කරන භාෂාවෙනි.

## පළාත් පාලන මැතිවරණ පැවැත්වෙන්නේ කෙසේ ද?

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ. පරිදි සියලු මැතිවරණ එම කොමිෂන් සභාව සහ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් මැතිවරණ නීතිය අනුව පැවැත්විය යුතුය. එම කොමිෂන් සභාව තවම පිහිටුවා නැති බැවින් දැනට සිටින මැතිවරණ කොමසාරිස්වරයා විසින් එම බලතල භාවිත කොට මැතිරණ නීති ක්‍රියාත්මක කරයි.

## මුදල් පිළිබඳ නීතිය කුමක් ද?

වරිපනම් හෝ බදු පැනවීම කළ යුත්තේ පාර්ලිමේන්තුව සම්මත කරන ලද නීතියක් යටතේ පමණි. (ආ.ක්‍ර.ව්‍ය 148)

## මුදල් කළමනාකරණය ගැන තත්වය කුමක් ද?

පාර්ලිමේන්තුවේ පොදු ගිණුම් කාරක සභාව සහ පළාත් සභාවේ ගිණුම් කාරක සභාව ගිණුම් වාර්තා ගැන සොයා බලයි. එම වාර්තා සපයන්නේ විගණකාධිපතිය . ඒ නිසා පළාත් පාලන - ආයතන වල ගිණුම් විගණනය කිරීම ඔහුගේ වගකීම වේ ආ.ක්‍ර.ව්‍ය 154(1)=

## පළාත් සභාවට, පළාත් පාලන ආයතන කෙරෙහි ඇති බලතල මොනවා ද?

පළාත් සභාවලට පැවරී ඇති විෂය ලැයිස්තුවේ (9 උපලේඛනය) පළාත් පාලනය එකකි (ආ.ක්‍ර.ව්‍ය 154 අ) ඒ අනුව පළාත් සභාවක් විසින් අදාළ පළාත් පාලන

ආයතන විසින් පිළිපැදීමට නීති (ප්‍රඥප්ති) පැනවිය හැකිය.

එහෙත් පනත් වලින් එනම් මහ නගර සභා, නගර සභා ප්‍රාදේශීය සභා පනත් වලින් දී ඇති බලතල ඉවත් කරන නීති පැනවිය නොහැකිය. බලතල වැඩි කරන නීති පැනවිය හැකිය. එහිදී පළාත් ආණ්ඩු කාරයාගේ බලය පළාත් අමාත්‍යවරුන් මගින් ක්‍රියාත්මක වේ.

පළාත් පාලන සේවකයන් අයත් වන්නේ පළාත් රාජ්‍ය සේවයට යි. ඒ සම්බන්ධ බලතල පළාත් රාජ්‍ය සේවා කොමිසමට පැවරෙන්නේ ආණ්ඩුකාරවරයාගෙනි.

පළාත් පාලන ආයතන වල දූෂණ හා අක්‍රමිකතා ගැන පැමිණිලි විභාග කොට නිර්දේශ නිකුත් කිරීමට ඔම්බුඩ්ස්මන්වරයා හෙවත් පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට බලය ඇත. ( ආ.ක්‍ර.ව්‍ය 156)

ස්වභාවික යුක්තියට පටහැනිව ක්‍රියාකර ඇතැයි කියන පැමිණිලි ඔප්පු වුවහොත් පළාත් පාලන ආයතන වලට එරෙහිව රිට් ආඥා නිකුත් කිරීමට පළාත් මහාධිකරණයට බලය පැවරී ඇත. (ආ.ක්‍ර.ව්‍ය 154 ග.1)

## පළාත් පාලන ආයතන පිහිටුවන්නේ කෙසේ ද?

පළාත් පාලන විෂයභාර ඇමතිවරයා ගැසට් පත්‍රයේ පළකරනු ලබන ප්‍රකාශයකිනි.

පිහිටුවන ප්‍රදේශය සහ එහි සීමා, නිලනාමය ප්‍රකාශයට පත්වේ. පළමුව පිහිටුවූ පසු. ජන්ද විමසීම් මගින් පවත්වා ගැනේ.

සීමා නියමයේ දී ප්‍රාදේශීය සභා උප දිසාපති කොට්ඨාස වලට අනුරූපව පිහිටුවනු ඇත. එම සීමාවේ මහ නගර සභා, නගර සභා ප්‍රදේශ අත් හැරේ.

(මේ සම්බන්ධයෙන් පනත් තුනේම 2වන වගන්තිය අදාළ වේ)

දින වකවානු, සභික සංඛ්‍යාව සහ ධූර කාලය ඇමතිවරයා ප්‍රකාශයට පත් කරයි. ධූරකාලය මාස 48 (අවු 4) කි. එය අඩු වැඩි කළ හැකිය. (ම.න.ස/න.ස. 10 වගන්තිය, ප්‍රා. ස 5 වගන්තිය) සභාවක සාමාන්‍ය රැස්වීම් මසකට එකක් පැවැත්වේ. විශේෂ රැස්වීම් අවශ්‍යතාව අනුව ය.

## කමිටු පිහිටුවීම ගැන තත්වය කුමක් ද?

අදාළ කරුණු ගැන සොයා බලා වාර්තා කිරීමට කමිටු පිහිටුවා ගත හැකිය.

**මහ නගර සභාවකට :**

මුදල් ස්ථාවර කමිටුවක් සහ තවත් ස්ථාවර කමිටු දෙකකට වැඩි ගණනක් නගරාධිපති හැර සභිකයන්ගෙන් පමණක් සැදේ. එක් සභිකයකුට ස්ථාවර කමිටු දෙකකට පත්විය හැකිය. මුදල් ස්ථාවර කමිටුවට පමණක් නගරාධිපති ඇතුළුව හය දෙනෙකි. අනික් කමිටු වලට සභිකයන්ගෙන් හය දෙනෙකි. තෝරා ගැනීම ඡන්දයෙනි. මහ නගර සභාවේ එම කමිටුවලට සභාවේ පොත්පත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර් සහ අනෙක් ලේඛන පරීක්ෂා කළ හැකි ය.

මහ නගර සභා කමිටුවලට බාහිර පුද්ගලයන් පත් කළ හැකි බවක් සඳහන් නොවේ.

## නගර සභා කමිටු

උපදේශක කමිටු පත්කර ගත හැකිය. අඩක් සභිකයන්ගෙන් හා අඩක් පුරවැසි නියොජිතයන්ගෙන් යුක්ත වේ. වෙනත් නගර සභා සහ මහ නගර සභා සමග හවුල් කමිටුවක්ද පිහිටුවිය හැකිය.

මෙසේ නගර සභා වලට පුරවැසියන්ට සහභාගි විය හැකි ය.

**ප්‍රදේශීය සභා කමිටු :**

විෂයයන් හතරකට උපදේශක කමිටුව බැගින් පිහිටුවිය හැකිය.

1. මුදල් හා ප්‍රතිපත්ති සැකසීම.
2. නිවාස හා ප්‍රජා සංවර්ධනය
3. කාර්මික සේවා
4. පරිසර හා පහසුකම්

කොටසක් සභිකයන් ගෙන් හා කොටසක් බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් යුක්ත වේ. මෙම

උපදේශක සභාවලින් බලතල කාර්යයන් හා වගකීම් ගැන උපදෙස් දීම සිදුවේ.

## පළාත් පාලන ආයතනවල බලතල හා කාර්යයන් මොනවා ද?

පළාත් පාලන ආයතන තුනටම බලපාන ඉඩම් හා දේපළ පරිපාලනය

ම.න.ස 35, 36, 37 ද
න.ස 33, 34 ද
ප්‍රා.ස 16, 17, 18 ද අදාළවේ.

### (අ.) සභාවට පැවරෙන දේපළ

- මුඩුබිම් හා එළිමහන් ස්ථාන
- කළු ගල්, කබොක් ගල්, බොරලු වළවල්.
- පොදු තටාක හා ඔයවල්
- පොදු වැව්, පොකුණු හා ඇලවල්
- ගොඩනැගිලි ඇති හෝ නැති රජයේ ඉඩම්

## (ආ) අත්පත් කර ගැනීමෙන් පැවරෙන දේපළ

- පොදු උද්‍යාන, වතු හා විවෘත භූමි
- පොදු පාරවල්, වීථි, ඇලමාර්ග, පාලම් හා ඒවාට සම්බන්ධ ඉඩම් හා ඉදි කිරීම්.
- පොදු වෙළඳ පොළවල් කර්මාන්ත ඉදිකිරීම් හා ඒවාට සම්බන්ධ දේපළ.
- වෙනත් සියලු පොදු ගොඩ නැගිලි හා ඒවා පිහිටි බිම්.
- සියලු පහන්, පහන් කනු, යකඩ ආධාරක ආදිය.

ඉහත සඳහන් දේපළ නීතියෙන් බලය ලැබී ඇති කාර්ය සඳහා පරිපාලනයට හා එයින් ලැබෙන ආදායම් නීතියෙන් ඉඩ දී ඇති කාර්ය සඳහා යොදා ගැනීමට ද හැකිය. රජයේ දේපළ රජයටම අයත් ය. පැවරෙන විට තිබුණු කොන්දේසි කඩ කළ නොහැකියි.

## වෙනත් බලතල මොනවා ද?

සිය අරමුදල් වලින් පහත සඳහන් කටයුතු කළ හැකිය

- මාතෘ දාරක සුබ සාධන කටයුතු
- වින්නඹුවන් පුහුණු කිරීම
- නිවාස යෝජනා ක්‍රම
- පුණ්‍ය කටයුතු
- හදිසි ස්වභාවික ආපදා කටයුතු
- දුර්භික්ෂ, වසංගත ආදි ආපදා කටයුතු

(ම.න.ස 188අ, න.ස.35 ආ, ප්‍රා.ස 19 vii වගන්ති අදාළ වේ.)

- බල ප්‍රදේශයේ අධ්‍යාපන පහසුකම්. (ගොඩ නැගිලි, ගෘහ භාණ්ඩ, ක්‍රීඩා භූමි, නේවාසිකාගාර, ගුරු නිවාස, ක්‍රීඩා උපකරණ, පුස්තකාල පහසුකම් සඳහා සැලසුම් අදාළ බලධරයන්ට ඉදිරිපත් කිරීම)
- බල ප්‍රදේශයේ පාසල් විවෘත කිරීම, වසා දැමීම, ඒකාබද්ධ කිරීම, නම් කිරීම, උසස් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම. (ම.න.ස 40 (1), න.ස 36 උ৯උ৯, ප්‍රා.ස. 18x1x අආ)

- ආගමික උත්සව සංවිධානය, දහම් පාසල් හා ශාසනාරක්ෂක මණ්ඩල පැවැත්වීම, සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම, සාහිත්‍ය පොත් ප්‍රකාශනය, කලාකරුවන්ට ශිල්පීන්ට ත්‍යාග ප්‍රදානය, ආදිය (ම.න.ස.188 (1) ඒ.ඒ.න.ස 159 (1) ඈ ඈ ඈ, ප්‍රාදේශ සභා. 19(1) xvii)
- දිළිඳු සහන සැලසීම

## පළාත් පාලන ආයතන වර්ග තුනටම බලපාන වෙනත් සාමාන්‍ය බලතල හා කාර්ය මොනවා ද ?

- සේවා හෝ භාණ්ඩ සැපයීමේ ගිවිසුම් ඇති කිරීම
- පොදු කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.
- නඩු පැවරීම හා පවරනු ලැබීම
- පොදු කාර්ය සඳහා ඉඩම් මැනීමට බලය පැවරීම
- පොදු කාර්ය භාරකරු ලෙස ක්‍රියා කිරීම.

## මහ නගර සභා සහ නගර සභාවලට පමණක් අදාළ කාර්ය තිබේ ද?

ආයතනයට අයත් ඉඩමක ස්මාරකයක් ඉදිකළ හැකිය ඒ සඳහා පළාත් පාලන ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය අවශ්‍යය (ම.න.ස 37, නස 34 වගන්ති අදාලවේ)

උද්‍යාන ආදිය නම් කිරීම සඳහා ද එම ක්‍රියාමාර්ගයම යෙදේ.

## මහ නගර සභා වලට පමණක් අදාළ බලතල තිබේ ද?

ශ්‍රීලංකාවෙන් පිටත සේවයක් යෙදවීම හෝ භාණ්ඩ ආදිය සැපයීම සඳහා ගිවිසුම් ඇතිකර ගත හැකිය. (ම.න.ස 39 (1) වගන්තිය)

රජයේ හෝ නගර සභාවේ ඉඩමක අවසරයක් නැතිව ගොඩ නැගිල්ලක් තැනුවහොත් දින 14ක් කල් දී නගර සභාවට එය කඩා දැමිය හැකිය. (ම.න.ස. 42 ව)

## ප්‍රාදේ. සභාවට පමණක් අදාළ බලතල තිබේ ද?

- තොටුපලවල් පිහිටුවීම හා පැවැත්වීම
- සතුන් බෝ කිරීම ගැන පර්යේෂණ පැවැත්වීම
- පර්යේෂණ ගොවිපළවල් හා පට්ටි ගවයන් නඩත්තුව.
- ගැමි කාන්තා සංවර්ධනය සඳහා කටයුතු කිරීම {19(1) XXII}
- තොරාගත් ගම්වල සංවර්ධන ව්‍යාපෘති පැවැත්වීම
- ග්‍රාම සංවර්ධන සමිතිවලට ආධාර කිරීම. (ප්‍රා.ස.19:1) XIV අදාළ වේ.)

## පළාත් පාලන ආයතන තුනටම පැවරෙන විශේෂ වගකීම් හා කාර්යයන් මොනවා ද?

1. වීථි/මංමාවත්
2. මහජන සෞඛ්‍ය සේවා
3. මහජන උපයෝගිතා සේවා - වශයෙන් ක්ෂේත්‍ර තුනකි.

මහ නගර සභා - පනතේ 47 සිට 95 දක්වා වගන්ති වලද නගර සභා ආඥා පනතේ 44-102 වගන්තිවලද, ප්‍රාදේශීය සභා පනතේ 21-77 දක්වා වගන්ති වලද එම කාර්ය සඳහන් වේ.

## ආයතන තුනටම අදාළ පොදු කටයුතු මොනවා ද?

### 1. වීථි/මංමාවත් තැනීම හා වැඩි දියුණු කිරීම.

අලුත් වීථි/මංමාවත් තැනීම. විවෘත කිරීම, විශාල කිරීම. ඒසඳහා ඉඩම් අත්පත් කර ගැනීම. අත් හරින ලද වීථි/මංමාවත් විකිණීම, බදු දීම, හුවමාරු කිරීම, වීථි/මංමාවත් වල බාධක ඉවත් කිරීම, වීථි/මංමාවත් නම් කිරීම, ගෙවල් අංක යෙදීම. වීථි/මංමාවත් නම් කිරීම හා නම් වෙනස් කිරීම කර්මාන්ත හෝ ව්‍යාපාර සඳහා පාරවල් තැනීම.

වීථි රේඛා සහ ගොඩ නැගිලි සීමා ලකුණු කිරීම. වීථි/මංමාවත් ඔස්සේ ගොඩ නැගිලි ඉදි කිරීමේදී ප.පා. ආයතනයේ අවසර ලබා දියයුතුය. එසේ නොවන විට අනවසර ඉදි කිරීම් ලෙස සලකා ඉවත් කිරීම (ම.න.ස 42, න.ස 77, ප්‍රා.ස 52)

පොදු රථ වාහන සේවා පැවැත්වීම.

වීථි/මංමාවත් වලට හානි සිදුවන ක්‍රියා වැළැක්වීම.

මංමාවත්වල සිදුවන පීඩාකාරී ක්‍රියා වැළැක්වීම.

අයාලේ යන ගවයන් ඇල්ලීම.

විශේෂ කටයුතුවලට වීථි/මංමාවත් ප්‍රයෝජනයට ගැනීම එනම් ජලය ගෑස්, විදුලිය ආදී මහජන සේවා පැවැත්වීම සඳහා

**ම.න.ස සහ න.ස පමණක් කළහැකි කටයුතු**

ට්‍රෑම් රථ මාර්ග තැනීම හා පැවැත්වීම

**ප්‍රා.ස. පමණක් අදාළ කටයුතු**

ප්‍රා.ස.ට අයත් පාරවල් හා පටුමං ලකුණු කර අත්පත් කර ගැනීමට නීත්‍යනුකූල ලෙස කටයුතු කිරීම.

**මහජන සෞඛ්‍යය**

සෑම පළාත් පාලන ආයතනයක්ම, එනම් මහනගර සභාවක්ම, නගර සභාවක් ම, ප්‍රාදේශීය සභාවක්ම තම බල ප්‍රදේශයෙහි

- **මහජන සෞඛ්‍යය වැඩි දියුණු කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා පොදු පරිපාලන අධිකාරියක් වේ.**

(ම.න.ස 96, න.ස 103 සහ ප්‍රා.ස. 78 වගන්ති මගින් බලය පැවරේ) ප්‍රාදේශීය සභා, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා මගින් එම කටයුතු කළ යුතුවේ. ම.න.ස සහ න.ස. වලට වෙනත් පනත් වලින් ද එම බලය පැවරේ. උදා: පීඩා පිළිබඳ ආ.ප. සහ නිවාස හා නගර සංවර්ධන ආ.ප.

- **ජලාපවහනය**

පොදු කානු ඉදිකිරීම, නඩත්තුව, වසා දැමීම පිළිබඳව ම.න.ස 97-104, න.ස 104-109, ප්‍රා.ස 79-84 වගන්ති අදාළවේ. වැහි වතුර බැස යාමට බාධා කරන අයට එරෙහිව නීති මගින් ක්‍රියා කළ හැකිය. අවසර නැතිව එම කානු උඩින් ගොඩනැගිලි තැනීම වරදකි. ඒවා කඩා දැමීමට ප.පා ආයතනයට බලය ඇත.

කානු සම්බන්ධයෙන් මහ නගර සභාවලට අමතර කොන්දේසි පැනවිය හැකිය.

- **වැසිකිළි**

(ම.න.ස. 118-121, න.ස 110-117, ප්‍රා.ස. 85-92 වගන්ති අදාලවේ)

සියලු නිවාස, ගොඩනැගිලි හා ඉඩම් සඳහා ප්‍රමාණවත් වැසිකිලි පහසුකම් සැපයීම සහතික කිරීම, මහජනයා ගැවසෙන ස්ථානවල පොදු වැසිකිළි පහසුකම් තිබීම හා පෞද්ගලික හා පොදු වැසිකිළි නිසි ලෙස පවත්වා ගැනීම ගැන සොයා බැලීම හා අලුත් වැඩියා කිරීම, වසා දැමීම හා කඩා ඉවත් කිරීම සඳහා නියෝග කළ හැකිය.

- **සෞඛ්‍යයට අහිතකර ගොඩනැගිලි**

නිසි සෞඛ්‍ය තත්වයෙන් පැවැත්වීමට නියෝග කළහැකි අතර එසේ නැතිවිට කඩා ඉවත් කිරීමට බලය ඇත (මනස 122-123, න.ස 121 - 122, ප්‍රා.ස 96-97 අදාළය)

සෞඛ්‍යයට අහිතකර ලෙස නිවාස වල නිවැසියන් සිටින විට එය වැළැක්වීමට පියවර ගත හැකිය. නඩු පැවරීමටද (ම.න.ස 124, න.ස 123, ප්‍රා.ස 98) බලය ඇත.

- **නිවාස වල හුණු ගෑමට නියම කිරීම**

  කොටසක හෝ මුළු නිවසේ හුණු ගෑමට නියම කළ හැකිය. (ම.න.ස 125, න.ස 124, ප්‍රා.ස 99)

- **මලාපවහනය සහ කසළ ශෝධනය**

  පාරවල කුණු ඉවත් කිරීම, වැසිකිළි නිසි පරිදි පවිත්‍ර කිරීම.

  බැහැර කරන කසළ හා මල ප.පා. ආයතනයේ දේපළක් වේ.

  (ම.න.ස 129-131, න.ස. 118-120, ප්‍රා.ස 93-95 වගන්ති)

## පීඩා වැළැක්වීම

ප්‍රදේශයේ වැළැක්විය යුතු පීඩා මොනවාදැයි, ප.පා. ආයතනය වරින්වර සොයා බැලිය යුතුය.

(ම.න.ස 132-136, න.ස. 126-128, ප්‍රා.ස 108-107)

- පෞද්ගලික ඉඩම්වල පීඩාකාරී වගුරුබිම්, ජලාශ පුරවා දැමීමට ක්‍රියා කිරීම.

- වීථි ළමයින්ගෙන් සිදුවන පීඩා - භාරකරුවන්ට වගකීම පැවරීම

- පොදු නාන ස්ථානවල සතුන් නෑවීම, රෙදි සේදීම තහනම් කිරීම
- ඇලවල් අපවිත්‍ර කිරීම ගැන නඩු පැවරීම.
- කර්මාන්ත ශාලාවලින් සිදුවන පරිසර දූෂණය වැළැක්වීම.
- අන්තරායදායක ගස් කපා දැමීමට ක්‍රියා කිරීම.
- මහ නගර සභාවලට පමණක් (128ව.) කර්මාන්ත ශාලාවක් හෝ ව්‍යාපාරයක් වසා දැමීමට මහෙස්ත්‍රාත් අධිකරණයෙන් ආඥාවක් ලබාගත හැකිය.
- ආසාදන රෝග, වසංගත රෝග වැළැක්වීම සඳහා ක්‍රියා කිරීමට මහ නගර සභාවලට බලය පැවරී ඇත. (137-144 වගන්ති)
- අප්‍රසන්න හෝ අන්තරාදායක කර්මාන්ත සඳහා බල පත්‍රදීම හා අවලංගු කිරීම මහ නගර සභාවන්ට පමණක් පැවරෙන බලයකි. (145-148)

මහජන උපයෝගිතා සේවා

- ජලසම්පාදනය
- වීථි, පොදු ස්ථාන හා ගොඩනැගිලි ආලෝකමත් කිරීම
- විදුලි ආලෝකය හෝ විදුලි බලය සැපයීම
- පොදු නාන ස්ථාන ඇති කිරීම.

මෙම සේවා පහසුකම් සැපයීමට සෑම පළාත් පාලන ආයතනයකටම වගකීම පැවරේ.

වෙළඳ පළවල් ඇති කිරීම ද පැවරෙන අතර මහ නගර සභාවලට මිනිස් පරිභෝජනයට නුසුදුසු ආහාර පාන විකිණීම පාලනය කිරීමේ බලය ඇත.

**නගර සභා සහ ප්‍රාදේශීය සභාවලට**

- වැසිකිළි ලෑලි නිපදවා නිපැයුම් මිලට සැපයීම.
- දුප්පත් අයට නිවාස සැපයීම.

යන වගකීම් ද පැවරේ.

(ම.න.ස 40(ද), 155-160, න.ස 129-152, ප්‍රා.ස 108-121 වගන්ති අදාළවේ)

## ගාස්තු හා වරිපනම් බදු පැනවීම

මහජන උපයෝගිතා සේවා පැවැත්වීම උදෙසා ගාස්තු හෝ වරිපනම් බදු අය කිරීමට නගර සභාවලට ද (130) ප්‍රාදේශීය සභාවලටද (109) බලය ඇත.

අනෙක් පළාත් සභාවල එකඟත්වය ඇතිව, ගාස්තු අයකොට යාබද ප්‍රාදේශවලට මෙම සේවා සැපයිය හැකිය (න.ස 131, ප්‍රා. ස 114)

## වෙළඳ පළවල්

මහ නගර සභා විසින් වෙළඳ පළවල් සැපයීම, කුලී අය කිරීම, අතුරු නීති මඟින් පාලනය කිරීම, එම ස්ථාන බදු දීම, විකිණීම කළහැකිය. (ම.න.ස 159)

නගර සභා විසින් පොදු වෙළඳ පළවල් පිහිටුවීම හා පැවැත්වීම, පිරිසිදු කිරීම ආදිය කළ යුතුය. පෞද්ගලික වෙළඳ පළවල් පාලනය, අධීක්ෂණය කළයුතුය බලපත්‍ර දීම, බලපත්‍ර නොදීම, වසා දැමීම කළ හැකිය.

වෙළඳ ප්‍රදේශ නියම කළහැකි අතර, මස්, මාළු, එළවළු විකිණීම යම් නියමයන්ට යටත් කළහැකිය.

## ප්‍රාදේශීය සභාවල බලතල

පොදු වෙළඳපල, ගම්බද පොළවල් පිහිටුවීම පැවැත්වීම, පාලනය කිරීම කළහැකිය.

පෞද්ගලික වෙළඳපළවලට බලපත්‍ර දීම කළහැකිය.

සෑම මහ නගර සභාවකට ම නාගරික මහේස්ත්‍රාත්වරයකු සිටිය හැකිය. පනත් රාශියක වැරදි පිළිබඳ නඩු විභාග කළ හැකිය. (161-169).

මහ නගර සභාවකට නාගරික කොමසාරිස්වරයෙක් සිටී. නගරාධිපති ළඟට සිටින ප්‍රධාන විධායක නිලධරයා වේ (170-172

**මහ නගර සභාවකට යෝජනා සම්මතයෙන් පුණ්‍ය කොමසාරිස් ධුරයක් ඇති කළ හැකියි. ඔහුගේ කටයුතුඃ**

- පුණ්‍ය සමිතිවලට සහය වීම
- ආධාර මුදල් පාලනය කිරීම
- දිළිඳුකම, ව්‍යසන, විරැකියාව ගැන යෝජනා ඉදිරිපත් කිරීම.

- සහන සැලසීමට ක්‍රියා කිරීම (174)

මහ නගර සභාවක විධායක නිලධාරීන් වන්නේ යෝජනා සම්මතයෙන් ප්‍රකාශ කරණු ලබන අයයි. එනම්. එම කාලයේ සභාපති ද, පුණ්‍ය කොමසාරිස් ද, නාගරික කොමසාරිස්ද විධායක නිලධාරීහු වෙති (175).

පළාත් පාලන සේවයේ නොවන සේවකයන් පත් කිරීම. විනයානුකූල කටයුතු කිරීම, අර්ථසාධක ආදිය පිළිබඳ කටයුතු කොමසාරිස් මගින් සිදුවේ. (183)

## මුදල් හා මූල්‍ය පාලනය

මේ සම්බන්ධ නීති රීති පළාත් පාලන ආයතන වර්ග තුනටම අදාළව ඇත.

## මහ නගර සභා

මහ නගර සභා අරමුදල - ණය, - අයවැය ලේඛනය, ඇස්තමේන්තු, ගිණුම්, ගිවිසුම් වරිපනම් සහ බදු වශයෙන් විස්තර වී ඇත.

## මහනගර සභා අරමුදල (185-190)

අ) වරිපනම් බදු, බදු, තීරු බදු, ගාස්තු හා වෙනත් අය කිරීම්.

ආ) නාගරික අධිකරණයේ දඩමුදල්, වෙනත් දඩමුදල්

ඇ) මුද්දර ගාස්තු

ඈ) විකිණීම්, බදුදීම් වලින් ලැබෙන මුදල්

ඉ) දේපළවලින් හෝ සේවාවන්ගෙන් ලැබෙන මුදල්.

ඊ) පාර්ලිමේන්තුව විසින් පවරා දෙනු ලබන ආදායම්

උ) ඇමතිවරයා වෙන්කර දෙන දීමනා.

ඌ) සභාවේ බලතල හා කාර්යවලින් උපදින මුදල්

මහ නගර සභා අරමුදල් නමින් එම මුදල් ඇමතිවරයා අනුමත කළ බැංකුවක ගිණුමෙහි තැන්පත් කළ යුතුය. (186)

එම මුදල් වලින් කොටසක් ආයෝජනය කළ හැකිය (ආණ්ඩුවේ සුරැකුම් පත්වල, රාජ්‍ය උකස් හා ආයෝජන

බැංකු ණය කර වල, ආණ්ඩුවේ වෙනත් සහතික සුරැකුම් පත්වල (187)

## අරමුදල ප්‍රයෝජනයට ගැනීම (188-1)

(අ) කම්කරු වන්දි ගෙවීම

(ආ) දේපළ රක්ෂණය සඳහා

(ඇ) නීතියක් යටතේ ගෙවීමට නියමිත මුදල්

(ඈ) වීථි, පාලම් තැනීම, ආලෝකය සැපයීම, නඩත්තු ආදී කටයුතු

(ඉ) වෙළඳ පොළවල්, සෞඛ්‍ය කටයුතු, ජල සැපයීම්, ක්‍රීඩා පිට්ටනි වැව්, ළිං ආදිය තැනීම හා පාලනය සඳහා

(ඉඉ) සභා රැස්වීම් වලට සංග්‍රහ වියදම්

(ඊ) නිවාස යෝජනා, ගොඩ නැගිලි නඩත්තු ආදිය.

(උ) වීථි, කානු පිරිසිදු කිරීම, පීඩා නතර කිරීමේ වියදම්.

(ඌ) පාසල් සඳහා සභාවේ ගෙවීම්.

(එ) නාගරික සේවා සඳහා ගොඩනැගිලි තැනීම හා මිලට ගැනීම

(ඒ) මාතෘ හා දාරකාභිවෘද්ධි කටයුතු. ආපදා වියදම් සහ පුණ්‍යාධාර.

(ඒඒ) ආගමික, සංස්කෘතික, සාහිත්‍ය කටයුතු සංවිධානය.

(ඔ) විනෝද කටයුතු, දිළිඳු සහන, ආබාධිතයන් පුනරුත්ථාපනය පුණ්‍ය හෝ සුබ සාධක ආධාර දීම.

(ඕ) පොදු උත්සව

(ක) පොදු වැදගත්කමින් යුත් උත්සව වියදම්

(ක) 289 ව. යටතේ නගරාධිපතිගේ සහ සභිකයන්ගේ දීමනා

(ග) ගිනි නිවන හමුදාවක් පැවැත්වීම

(ග1) සභිකයන්ට නිල දුරකථන සැපයීම

(ච) යම් වෙනත් නීතියක් යටතේ මහජන සේවා කටයුතු

(ජ) මහජන පුස්තකාල පැවැත්වීම .

(ජජ) නිවාස ස්ථාන නඩත්තුවට දිරි ගැන්වීමේ දීමනා

(ට) ඛනිජ තෙල් පනත යටතේ නාගරික කොමසාරිස් ගේ වියදම්

(ඩ) නීතියක් යටතේ ක්‍රියා කිරීම නිසා නගරාධිපතිට කොමසාරිස්ට, නිලධරයකුට වන වියදම්.

(ණ) නීතියක් යටතේ ගෙවීමට බලය ලැබෙන මුදල්

අරමුදලින් ගෙවීමට බලය පැවරුණු නිලධරයන් දෙදෙනකු අත්සන් කළ යුතුය. කොළඹ මහ නගර සභාව වාර්ෂිකව කොළඹ නීති පුස්තකාල කමිටුවට මුදලක් ගෙවිය යුතුය. (188-2-3)

**මුදල් ණයට ගැනීම (191)**

ඇමතිවරයාගේ අනුමැතිය අවශ්‍යය.

(අ) බාරගත් වැඩක් කරගෙන යාමට

(ආ) පොදු සේවයක් සඳහා

(ඇ) ඒ සඳහා ඉඩමක් ගොඩ නැගිල්ලක් ගැනීමට

(ඈ) එම කාර්යයන්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ගැනීමට.

**ණය ලබා ගැනීමේ සීමා (192)**

සාමාන්‍ය වාර්ෂික ආදායම මෙන් දස ගුණයක් නො ඉක්මවා මුදලක් ලබාගත හැකිය. රජයේ ණය ඇතිවිට

නියමිත සීමාව ඉක්මවා ණය ගැනීමට ඇමතිවරයාට විධිමත් ලෙස අනුමතය දිය හැකිය.

**ණය ලබාගත හැකි ක්‍රම (193)**

(අ) උකස් මගින්

(ආ) ණයකර මගින්

(ඇ) නිවාස බැඳුම්කර මගින්

නිශ්චය කරන ලද කාලසීමාව තුළ ණය ආපසු ගෙවීමේ නියෝග ආඥා පනතේ ඇත.

**අයවැය ලේඛනය (211)**

නගරාධිපති විසින් වාර්ෂික ආදායම් හා වියදම් පිළිබඳ ලේඛනයක්, ස්ථාවර කමිටු විමසා සභාවට ඉදිරිපත් කළ යුතුය. දින 7කට පෙර සභිකයන්ට දිය යුතු අතර මහජනයාට පරීක්ෂා කර බැලීමට ඉඩ සැලසිය යුතුය ඒ ආකාරයෙන් ම පරිපූරක අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීමට ද නගරාධිපතිවරයාට ඉඩ තිබේ. (214)

අයවැය ලේඛනයන්ට සංශෝධන ඉදිරිපත් කිරීමට සභිකයන්ට ඉඩ තිබිය යුතුය (215)

එහෙත් අයවැය ලේඛනය සභාවේ සම්මත කරගෙන සංශෝධන නොතකා නගරාධිපතිට ක්‍රියාත්මක කළ හැකිය. (215අ)

අයවැය ලේඛනයේ ශීර්ෂවල වියදම් අඩුවැඩි කිරීමට ද ශීර්ෂවල මුදල් මාරුකිරීමට නගරාධිපතිට බලය පැවරී ඇත. එහෙත් අනුමත කර ඇති මුදල නොඉක්මවිය යුතුය. (216) අදාළ වර්ෂයෙන් පසු වියදම් කිරීමට බලය නැත. (217)

**ගිණුම්**

වාර්ෂික පරිපාලන වාර්තාවක් නගරාධිපති විසින් සභාවට ඉදිරිපත් කළ යුතුය. ලැබීම් සහ ගෙවීම් පිළිබඳ විස්තර සඳහන් විය යුතුය. ඒ පිළිබඳ සභාවේ යෝජනා සහිත වාර්තාවක් ඇමතිවරයාට ඉදිරිපත් කළ යුතුය (218).

විගණකාධිපතිවරයා විසින් සෑම මහ නගර සභාවකම ගිණුම් විගණනය කළ යුතුවේ (219)

විණාකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුව ඇති පොත්, ඔප්පු, ගිණුම්, වවුචර, ලේඛන නිසි ලෙස ඉදිරිපත් නොකිරීම දඬුවම් ලැබිය හැකි වරදකි. (221)

විගණන වාර්තා සභාවට ඉදිරිපත් කිරීම ද වර්ෂ අවසානයේ දී ඇමතිවරයාට යැවීමද අවශ්‍යය (222)

ගිණුම්වල අක්‍රමිකතා, අධිභාර නියම කිරීම සහ ඒ සම්බන්ධ ක්‍රියා පටිපාටියක් ද ඇත.

## ගිවිසුම්

වර්ෂයකට නොවැඩි කාලයක් සඳහා ගිවිසුම් ඇති කර ගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යයකි. ඒ සඳහා අයවැය ලේඛනයකින් මුදල් වෙන්වී තිබිය යුතුය (227)

වැඩක්, සේවයක් හෝ ද්‍රව්‍ය සැපයීමක් සඳහා ගිවිසුම් ඇතිකර ගත හැකිය. (228)

## ටෙන්ඩර්

(අ) ගිවිසුමට එළඹීමට පෙර ඇප ලබාගත හැකිය.

(ආ) ඒ සඳහා කොමසාරිස්වරයා විසින් ටෙන්ඩර් කැඳවිය යුතුය.

(ඇ) ටෙන්ඩර් පිටපත් සභාවට ඉදිරිපත් කොට, අයවැය ලේඛනයෙන් මුදල් වෙන්කර ඇති බව සනාථ වූ පසු ගිවිසුම සභාව අනුමත කළයුතුය.

සභාව අනුමත නොකළොත් ඇමතිවරයාගේ අනුමැතිය ඇතිව නගරාධිපතිට ගිවිසුමට ඇතුළත් විය හැකිය.

## වරිපනම් බදු සහ බදු

- වරිපනම් බදු සඳහා දේපළ තක්සේරු කිරීම
- බදු පැනවීමේ සහ අයකර ගැනීමේ ක්‍රියා මාර්ගය (230 - 244 හා 247 සඳහන්වේ)
- වාහන හා සතුන් ගෙන් බදු අයකළ හැකිය. (245-246)
- ස්ථාන බදු දීම වෙනුවෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තු අයකිරීම (247 අ)
- මහ නගර සභා සීමාවේ ඇති කර්මාන්ත වලින් බදු ගැනීම (247 අ)

- වෙළඳ ව්‍යාපාර බදු පැනවීම. (247ඇ)
- ප්‍රයෝජනයට නොගත් ඉඩම් වලින් බදු අය කිරීම (247ඈ)
- ඉඩම් වෙන්දේසි වලින් බදු ගැනීම (247 ඉ)
- රේන්ද පොළවල් පිහිටුවීම හා බදු ගැනීම (284)
- බදු අයකර ගැනීමේ ක්‍රියා මාර්ගය 252-266 සඳහන්වේ. සුළු මුදලක් වීම හා දිළිඳුකම මත බදු මුදල අත්හැර දැමිය හැකිය.

**නගර සභා පනත**

- සෑම නගර සභාවක්ම අරමුදලක් පිහිටුවිය යුතුය (න.ස. 158)
- දඩ මුදල්
- මුද්දර ගාස්තු
- මෙම න.ස. පනතින් පනවන බදු, ගාස්තු, ගෙවීම් ආදිය.
- වෙළඳාමෙන් හා ගනුදෙනු වලින් ලැබෙන ආදායම.

- සභාවේ දේපළවලින් හා පොදු සේවා පාලනයෙන් ලැබෙන මුදල්.
- සභාවේ දේපළවලින් හා පොදු සේවා පාලනයෙන් ලැබෙන මුදල්
- වෙනත් පවරා ඇති ආදායම් මාර්ග වල මුදල්
- පාර්ලිමේන්තුවෙන් පැවැරෙන ආදායම් මාර්ගවල මුදල්
- සිය බලතල හා යුතුකම් භාවිතයෙන් ලබා ගන්නා මුදල්

එම මුදල් ළඟම කච්චේරියේ හෝ අනුමත බැංකුවක තැන්පත් කළ යුතුය.

**අරමුදලෙන් වියදම් (159)**

- සේවා හා යුතුකම් ඉටුකිරීමේ වියදම්
- කම්කරු වන්දි ගෙවීම
- කම්කරු වන්දි රක්‍ෂණ ගෙවීම
- පාරිභෝගික දීමනා.
- ආපසු ගෙවීම්.

- දිළිඳු සහන අසරණ හා ආබාධ සහිත අයට දීමනා
- ආගමික හා නඩත්තුව වෙනුවෙන් දිරිදීමනා (209 A පරිදි)
- පොදු උත්සව සඳහා
- සභිකයන්ට නිල දුරකථන පහසුකම්
- පුස්තකාල ආදිය සඳහා
- රැස්වීම් සඳහා වියදම්

නිලධාරීන් සඳහා විශ්‍රාම හා පාරිතෝෂික ක්‍රම ඇතිකළ හැකිය (159A)

## වරිපනම් බදු

- වරිපනම් බදු පැනවීම හා අයකිරීම (160)
- එම බද්දෙන් නිදහස් කිරීම (161)

## බදු හා බලපත්‍ර ගාස්තු

- වාහන හා සතුන් පිළිබඳ බදු (163)
- බලපත්‍ර ගාස්තු (164)
- කර්මාන්ත බදු (165)

- කර්මාන්ත කීපයකට බදු (165 අඅ)

- ව්‍යාපාර හා වෘත්තීන් සඳහා බදු (165 අඅ)

- සංවර්ධනය නොකළ ඉඩම් වලින් බදු අය කිරීම (165)

- ඇතැම් ඉඩම් විකිණීම සම්බන්ධ බදු.

## දේපළ තක්සේරු කිරීම

වරිපනම් බදු සඳහා දේපළ තක්සේරු කිරීම (236-241)

දැන්වීම, පුද්ගලයන් කැඳවීම, පරීක්ෂණ පැවැත්වීම සභාපතිට කළහැකිය.

වරිපනම් සහ වෙනත් බදු අයකර ගැනීම ගැන මහ නගර සභා විධිවිධාන (170-171) නගර සභා වලට අදාළ වේ. බදු සහ ආදායම් පිළිබඳ සභාවේ ලේකම්වරයා ක්‍රියා කරයි.

අය කිරීම අත්හැර දැමීමද මහ නගර සභාවල මෙනි.

## ණය ගැනීම (173-175)

වරිපනම් සහ බදු ඇපයට තබා ණය ගැනීම කළ හැකිය.

ගිණුම්, ඇස්තමේන්තු සහ අයවැය ලේඛනය (176-180)

වැය පිළිබඳ ගිණුම් තබාගත යුතුය

එම ලේඛන නගර සභා වැසියන්ට බලා ගැනීමට සලසා තිබිය යුතුය.

ජනවාරි මාසයේ ගිණුම් ප්‍රසිද්ධ කළ යුතුය. කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව නගර වැසියන්ට බලාගැනීමට ඉඩ තිබිය යුතුය.

**අයවැය ලේඛනය (178-179)**

අයවැය ලේඛනය නියමිත දිනයකදී සභාවට ඉදිරිපත් කළ යුතුය. පරිපාලන වාර්තාවක්ද ඉදිරිපත් විය යුතුය. ලැබීම් හා වැය පිළිබඳ විස්තර සභාවට අවශ්‍යය (180). සති හයකින් කොමසාරිස් මගින් ඇමතිවරයාට යැවිය යුතුය.

**විගණනය**

සෑම ගිණුමක්ම විගණකාධිපතිගේ විගණනයට යටත් ය. සියලුම ලිපි ලේඛන පරීක්ෂා කිරීමට විගණන නිලධාරීන්ට හැකිය. සහාය නොදීම දඬුවම් ලැබිය හැකි වරදකි.

## මුදල් පිළිබඳ ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්ය මොනවාද?

124-176 දක්වා වගන්ති අදාළ වේ.

## ප්‍රා.ස. අරමුදල හැදෙන්නේ කෙසේ ද?

- දඩ මුදල් (දෙවන උප ලේඛනයේ පරිදි)
- මුද්දර ගාස්තු (තුන්වන උපලේඛනයේ ප්‍රදාන)
- ඇමතිවරයා විසින් කරනු ලබන ප්‍රදාන
- වරිපනම්, බදු, තීරු බදු, ගාස්තු සහ අය කිරීම්.
- විකිණීම්, බදු දීම් වලින් ලැබෙන මුදල් දේපළකින් හෝ සේවාවකින් ලැබෙන මුදල් ප්‍රා.ස.ට නීත්‍යානුකූලව හිමි ආදායම් මාර්ග.
- පාර්ලිමේන්තුවෙන් පවරා දෙන මුදල් හා ආදායම්
- ණයට ගන්නා මුදල්
- වෙනත් ආකාර වලින් ලැබෙන මුදල්

ඇමතිවරයා ගැසට් මගින් ''අනුමතකළ බැංකුවක'' ප්‍රාදේශීය සභා අරමුදලේ මුදල් තැන්පත් කළයුතුය (125)

**එම අරමුදලින් කෙසේ වියදම් කළ යුතුද?**

නිශ්චිත සුරැකුම් පත්වල කොටසක් තැන්පත් කළ හැකිය (126)

- මෙම පනත හෝ වෙනත් නීතියක් යටතේ පැවරෙන යම් කාර්ය ඉටු කිරීමට.
- කම්කරු වන්දි
- දේපළ හා කම්කරු රක්ෂණය සඳහා
- ප්‍රාදේශීය සභා කටයුතු වලදී හානි සිදුවන අයට දෙන සහන දීමනා.
- නියමිත ආපසු ගෙවීම්
- පුණ්‍ය කටයුතු - හදිසි ආපදා සඳහා වියදම්
- ගිනි නිවන හමුදාවක් පැවැත්වීම සඳහා
- පොදු සේවා හා කටයුතු පැවැරීමේ වියදම්
- සේවක සුබ සාධන වියදම්

- ආගමික, සංස්කෘතික, අධ්‍යාපනික උත්සව සඳහා
- විනෝද කටයුතු, පුස්තකාල ක්‍රීඩා කටයුතු සඳහා
- කාර්යයන් සඳහා යැපීම් සහ වියදම් .
- පළාත් පාලන ආයතන සංගම් පැවැත්වීමට
- රැස්වීම්, සම්මේලන ගමන් වියදම්
- ප්‍රා.ස. නිලධරයන්ගේ (සභාපති, ලේකම්)
- මේ පනතින් හෝ වෙනත් නීතියකින් ගෙවීමට බලය ලැබෙන වියදම්

## වරිපනම් බදු

නිශ්චල දේපළ මත  වරිපනම් බදු, හෙක්ටෙයරයකට වැඩි ගොවි ඉඩම් වලට අක්කර බදු පැනවිය හැකිය

ආගමික කාර්ය සඳහා යෙදෙන ඉඩම්, නොමිලේ අධ්‍යාපන කටයුතු සඳහා වන ඉඩම් වරිපනම් බද්දෙන් නිදහස් කළ හැකිය (134)

වරිපනම් ඇපයට තබා ප්‍රා.ස.ට ණය ලබාගත හැකිය (රජයෙන්, පුද්ගලයන්ගෙන් හෝ සංස්ථාවලින්) ඒ සඳහා ඇමති අනුමතය අවශ්‍යය. (172)

**අතුරු ව්‍යවස්ථා යනු මොනවා ද?**

පළාත් පාලන ආයතන පනත් වල සඳහන් නැති එහෙත් පැවරී ඇති බලතල හා යුතුකම් ක්‍රියාත්මක කිරීම සඳහා නීති පනවා ගැනීමට පළාත් පාලන ආයතනවලට බලය ලැබේ. එම නීති අතුරු ව්‍යවස්ථා නම් වේ.

මහ නගර සභා ආ.ප. 267-275

නගර සභා පනත 153-157

ප්‍රාදේශීය සභා පනත 122-128

ඇමති අනුමත කොට පාර්ලිමේන්තුවෙන් සම්මත විය යුතු එම අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීමට හා අවලංගු කිරීමට ද ප.පා. ආයතන වලට බලය ලැබේ.

අතුරු ව්‍යවස්ථා පනවන්නේ කුමන කාරණා ගැනද?

**මහ නගර සභා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකි කරුණු මොනවාද?**

- නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, නාගරික කොමසාරිස්, පූර්ණය කොමසාරිස්, නාගරික මහේස්ත්‍රාත් යන ධුර ඇති කිරීම
- පළාත් පාලන සේවයේ වෙන්වන සභාවේ නිලධරයන්ට හා සේවකයන්ට වැටුප්, දීමනා ආදිය ගෙවීම.
- ඔවුන්ට නිවාඩු දීම.
- නිලධරයන්ට, සේවකයන්ට කාර්ය පැවරීම.
- අස්තමේන්තු, අයවැය ලේඛන, ප්‍රකාශ, වාර්තා ආදියෙහි ආකෘති හැදීම
- ගිණුම් තැබීමේ ආකෘති
- නියමිත පොත්, නාමලේඛන හෝ වෙනත් ලේඛන ආකෘති

## ගොඩනැගිලි හා කර්මාන්ත ගැන

- අලුත් වීථිවල මට්ටම්, දිග පළල
- ගොඩනැගිලි බිත්ති, අත්තිවාරම්, දුම් කවුළු ව්‍යුහය, ආදී කරුණු
- උදුන් වල, තරප්පුවල ව්‍යුහය, මිනිස් වාසයට සුදුසු තැන් වල උස, වාතාශ්‍රය, ගෙබිම්වල ව්‍යුහය.
- වායු සංසරණය ගැන
- ගොඩනැගිලි ආශ්‍රිත විවෘත බිම් ප්‍රදේශවල ගල් ඇල්ලීම.
- භාවිත කළ යුතු ද්‍රව්‍යවල තත්වය
- ගොඩනැගිලිවල ඉදිරි සීමාව
- පේලි ගොඩනැගිලිවල වීථියට පෙනුම
- අලුත් ගොඩනැගිලි හෝ ඒවා වෙනස් කිරීම ගැන - ගාස්තු අය කිරීම
- කානු, ජල, වැසිකිළි, කැසිකිළි, නාන ස්ථාන ආදිය සැලසුම් කිරීම.
- ඒවා පරීක්ෂා කිරීම හා ගස්තු නියම කිරීම

- ජලාපවාහන කටයුතු සඳහා ගාස්තු නියම කිරීම
- අලුත් වීථි හා පාරවල් සඳහා කසළ, කානු හා ජලාපවාහන ක්‍රම සැපයීම.
- පොදු වැසිකිළි භාවිතය විධිමත් කිරීම.

## ජලය සම්බන්ධ කටයුතු

- ජලය අපතේ යැවීම වැළැක්වීම
- ජලය ගෙන යාම, පාවිච්චියට දීම, විධිමත් කිරීම, රැස්කිරීම ගැන නියමයන් පැනවීම.
- පොදු ජල සම්පාදනය
- පෞද්ගලික සේවා මගින් ජලය සැපයීම්
- මිනුම් ක්‍රමයට ජලය දීම
- ගෘහ කාර්යයන් නොවන කටයුතු සඳහා ජලය සැපයීම.
- ජලය සඳහා මුදල් අය කිරීමේ කාර්ය පටිපාටිය නියම කිරීම.
- ජල කර්මාන්ත පාලනය

## සනීපාරක්ෂක කටයුතු

- කරදර වැළැක්වීම
- මල මුත්‍ර ඉවත් කිරීම
- කානු, වැසිකිළි පරීක්ෂා කිරීම -මනුෂ්‍ය වාසයට නුසුදුසු ගොඩනැගිලි වසා දැමීම.
- පොද්ගලික ස්ථානවල කසළ ශෝධනය
- ආසාදක රෝග පාලනය
- තාවකාලික ගොඩ නැගිලි, ආසාදිත භාණ්ඩ පිරිසිදු කිරීම
- උෟරන් ඇති කිරීම පාලනය
- මැලේරියා ආදී රෝග වැළැක්වීම
- අස්හල්, ගවහල් ආදියට බලපත්‍ර දීම
- සභාවේ නොවන නාන හා සතුන් නාවන ස්ථාන අධික්ෂණය
- වීථි සම්බන්ධ කටයුතු
- වීථි දියුණු කිරීම
- වීථිවල, පාරවල බාධක ඉවත් කිරීම

- රථ වාහන ගමනා ගමනය විධිමත් කිරීම
- වීථි දැන්වීම් පුවරු ආදියට ගාස්තු නියම කිරීම

**ඉඩම් සහ දේපළ**

- ගොඩ නැගිලි, ඉඩම්, වර්ග කිරීම හා තක්සේරු කිරීම
- ඉඩම් හා ගොඩනැගිලි අයිතිකරුවන්ගේ නාම ලේඛනය හැදීම
- උකස් හිමියන්ගේ නම් ලියාපදිංචි කිරීම
- බදු අයකර ගැනීමට තහනම් දේපළ ගැන දැන්වීම.
- පෞද්ගලික හා පොදු ඉඩම් මැනීම්.
- පොදු තණබිම් බලා ගැනීම්.

**වෙළඳ පොළවල්, පොළවල්, බේකරි සහ ආහාර ද්‍රව්‍ය ගැන**

- බේකරිවලට හා එහි සේවකයන්ට බලපත්‍ර දීම
- ඇතිකරන සතුන් විකිණීම, පොළවල් පාලනය

- නගරයට ගෙනෙන අපථ්‍ය මස්, මාළු තහනම් කිරීම
- වෙළඳහල් පැවැත්වීමට බලපත්‍ර දීම.
- අතුරු ව්‍යවස්ථා වලට පටහැනිව වෙළදාම වැලැක්වීම
- මිල ලැයිස්තු පළ කිරීම.
- මිනුම් හෝ කිරුම් හෝ වශයෙන් භාණ්ඩ විකිණීම විධිමත් කිරීම
- ආහාර ද්‍රව්‍ය තොග හා සිල්ලර මිල නියම කිරීම.
- ගෝ ඝාතක ස්ථාන, කළමනාකරණය
- අයාලේ යන ගවයන් ගැන නියමයන්
- සතුන්
- එන්නත් කිරීම
- වරිපනම් බදු එකතුකිරිම
- ගාස්තු හා අය කිරීම් නියම කිරීම (මේ පනත යටතේ)
- සැලූන්වලට බලපත්‍ර නිකුත් කිරීම.

- පීඩාකාරී හෝ අන්තරායදායක කර්මාන්ත, ව්‍යාපාර අධීක්ෂණය හා පාලනය කිරීම.
- මුදල් මාරු කරන්නන්ට බලපත්‍ර දීම.
- ගණකාධිකාරීවරුන්ට හා විගණකවරුන්ට බලපත්‍ර දීම
- පොදු විනෝද ස්ථානවලට බලපත්‍ර දීම.
- ආහාර ද්‍රව්‍ය විකිණීම හෝ ගබඩා කිරීම පාලනය

**සංචාරක වෙළෙන්දන්**

- බලපත්‍ර හා කොන්දේසි නිකුත් කිරීම.
- භාණ්ඩ විකිණීම ගැන නියමයන් කිරීම.

**ලොන්ඩරි කටයුතු**

- ලොන්ඩරි සඳහා බලපත්‍ර දීම
- ලොන්ඩරිවල වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම.
- ආලෝකය, සංවාතනය, ජලාපවහනය ගැන නිමයන්
- ලොන්ඩරි මගින් රෝග බෝවීම වැළැක්වීම.
- එන යන ලොන්ඩරි භාණ්ඩ පරීක්ෂා කිරීම

- ආහාර, කෑම වර්ග, තේ, කොපි විකුණන තැන්වලට බලපත්‍ර දීම.

## කිරි පට්ටි

- කිරි පට්ටි කටයුතුවලට බලපත්‍ර දීම.
- කිරි හරකුන් පරීක්ෂා කිරීම.
- කිරි දෙනුන් පාලනය ගැන නියමයන් කිරීම.
- කිරිහල්වල පිරිසිදුකම
- කිරිවලින් ඇතිවිය හැකි රෝග ගැන පෙර උපක්‍රම.
- කිරි ප්‍රමිති කිරීම.
- උකු කළ, මුදවාපු කිරි, කිරි තෙල්, වෙඬරු, කේජු ආදිය ගැන නියමයන්.
- කිරි පට්ටි නිසා ඇති විය හැකි රෝග ගැන පරීක්ෂාව.
- කිරි පට්ටි නොවන තැන්වල දෙනුන්ට බල පත්‍ර දීම.
- ජේන්ද පොළවල් පිහිටුවීම හා පවත්වා ගෙන යාම.

- ගිනි නිවන හමුදාවේ සහය ලබා ගැනීම.
- දැන්වීම් ප්‍රදර්ශනය ගැන
- ජල සම්පාදනය, විදුලිය සැපයීම, වෙළඳ පොළවල්, පොදු ස්ථාන ආදිය ගැන ගාස්තු නියම කිරීම.
- වෙනත් මහජන සේවා ගැන ගාස්තු.
- අපවිත්‍ර ජලයෙහි මසුන් ඇල්ලීම තහනම් කිරීම. වෙරළ බඩ මසුන් ඇල්ලීම පහසු කිරීම.
- ශබ්ද විකාශන යන්ත්‍ර පාලනය කිරීම.
- බදු හා බලපත්‍ර ගැන වාර්තා තොරතුරු සැපයීම.
- කර්මාන්ත අපද්‍රව්‍ය පාලනය කිරීම.
- බලපත්‍ර දීම විධිමත් කිරීම.
- මෝටර් වාහන නැවැත්වීම කළමනාකරණය කිරීම.

## මේ ලේඛණය සඳහා උදවු වූ පොත්

1. පළාත් පාලනය සඳහා ශ්‍රී ලංකා ආයතනයෙන් පළ කර ඇති පොත්

2. ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව

3. මහ නගර සභා ආඥා පනත 1947/16

4. නගර සභා ආඥා පනත 1939/61

5. ප්‍රාදේශීය සභා පනත 1987/15)